# Career Planning Roadmap

## AI හමුවේ සුරක්ෂිත රැකියා හඳුනාගන්නා හැටි




Trainer: Mohamed Rushdi Hadhi

## හැඳින්වීම - Introduction

කෘතිම බුද්ධිය (Artificial Intelligence) යනු මනුෂ්‍යයා විසින් නිර්මාණය කරන ලද "කෘතිම මොළයක්" වැනිය. මෙය මිනිසාට වඩා වේගයෙන් දත්ත සැකසීම (Data Processing) සිදු කළත්, මිනිසා සතු ඇතැම් සුවිශේෂී හැකියාවන් ආදේශ කිරීමට AI වලට තවමත් නොහැකිය.

## 1. කෘතිම බුද්ධිය (AI) සතු දක්ෂතා සහ දුර්වලතා

| AI සතු දක්ෂතා (AI Strengths) | | AI සතු දුර්වලතා (AI Weaknesses) | |
|---|---|---|---|
| **Processing Speed** | විශාල දත්ත ප්‍රමාණයක් තත්පර කිහිපයකින් පරික්ෂා කර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව. | **Context Awareness** | වචනයක හෝ සිදුවීමක පසුබිම නිවැරදිව තේරුම් නොගතහොත් AI මගින් වැරදි තීරණ ගත හැකිය. |
| **Memory** | ඇතුළත් කර ඇති ඕනෑම තොරතුරක් නිවැරදිව මතක තබා ගැනීම සහ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට ඇති හැකියාව. | **Human Touch** | කරුණාව, ආදරය, ලැජ්ජාව හෝ සංවේදී බව AI සතු නොවේ. |
| **Prediction** | දත්ත විශ්ලේෂණය කර ඊළඟට කුමක් සිදුවේද යන්න පැවසීමට ඇති හැකියාව. | **Social Context** | සමාජයක පුද්ගලයෙකුට ලැබෙන ගෞරවය හෝ අපහාසය පිළිබඳව තේරුම් ගැනීමට AI වලට නොහැක. |

## 2. කෘතිම බුද්ධිය (AI) සහ රැකියා අවධානම

| AI මගින් ආදේශ කළ හැකි රැකියාවල ලක්ෂණ | | AI මගින් ආදේශ කළ නොහැකි රැකියාවල ලක්ෂණ | |
|---|---|---|---|
| **Repetitive Tasks** | දිනපතා එකම දෙය නැවත නැවත සිදු කරන රැකියා. | **High Human Interaction** | හෙද සේවය, ගුරු වෘත්තිය සහ උපදේශනය. |

| | | | |
|---|---|---|---|
| **Rule-based** | ස්ථාවර නීති මාලාවක් හෝ පියවර (SOPs) අනුගමනය කරන වැඩ. | **Creativity** | අලුත් අදහස් සහ කලාව සහ නව නිර්මාණ සිදු කිරීම. |
| **Data Heavy** | දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම ප්‍රධාන වූ රැකියා. | **Complex Judgment** | නීතිමය සහ සදාචාරාත්මක පැති සලකා බලා ගන්නා තීරණ. |
| **Low Human Interaction** | මිනිසුන් සමඟ සෘජුව ගනුදෙනු කිරීමට අවශ්‍ය නොවන රැකියා (උදා: කර්මාන්තශාලා සේවකයන්, මූලික මට්ටමේ Software Engineers) | **Unpredictable Environments** | ඉදිකිරීම් ක්ෂේත්‍රය හෝ කෘෂිකර්මාන්තය වැනි ක්ෂණිකව වෙනස් වන පරිසරයන්. |



## 3. ඔබ කරන රැකියාවට AI බලපෑම කොතරම්ද? (ස්වයං ඇගයීම)

ඔබේ රැකියාවට AI වලින් ඇති බලපෑම මැනීමට පහත ප්‍රශ්නාවලිය භාවිතා කරන්න.

(ලකුණු 1-5 දක්වා ලකුණු ලබා දෙන්න)

| **Automation** | **Human Factor** |
|---|---|
| 1. දිනපතා කරන්නේ එකම දේ ද? | 1. ඉගැන්වීම හෝ මඟ පෙන්වීම අවශ්‍ය ද? |

| | |
|---|---|
| 2. ලිඛිත නීති (SOP) දැඩිව අනුගමනය කරයි ද? | 2. සංවේදී මානුෂීය ප්‍රශ්න හැසිරවීමට තිබේ ද? |
| 3. වැඩිපුරම තිබෙන්නේ දත්ත විශ්ලේෂණය ද? | 3. අලුත් සංකල්ප/නිර්මාණ බිහි කිරීමට තිබේ ද? |
| 4. එකම ප්‍රශ්නවලට එකම පිළිතුරු ලබා දෙයි ද? | 4. සදාචාරාත්මකව තීරණ (Judgment) ගැනීමට තිබේ ද? |

**ප්‍රතිඵලය:** Automation ලකුණු වැඩි නම් සහ Human Factor ලකුණු අඩු නම්, ඔබේ රැකියාව AI මඟින් වෙනස් වීමේ අවදානම වැඩිය.

## 4. අනාගතය සඳහා සූදානම් වීම.

"AI මඟින් ඔබේ රැකියාව උදුරා ගන්නේ නැත. නමුත් **AI භාවිතා කරන මනුෂ්‍යයෙකු විසින්** AI භාවිතා නොකරන ඔබව ප්‍රතිස්ථාපනය කරනු ඇත."

- **AI සමඟ ජීවත් වීමට පුරුදු වන්න:** කෘතිම බුද්ධියට (AI) බිය නොවී එය ඔබේ සහායකයෙකු (Tool/Buddy) ලෙස භාවිතා කරන්න.
- **නිපුණතා ඉහළ නංවා ගැනීම (Up-skilling):** AI වලට කළ නොහැකි මානුෂීය කුසලතා වර්ධනය කරගන්න.
- **ඵලදායීතාවය (Productivity):** AI මෙවලම් (ChatGPT වැනි) භාවිතා කර ඔබේ රැකියාවේ වැඩ වේගවත් කරගන්න.

